# දැන්වීමයි

## **මහපොළ ශිෂ්‍යත්ව සහතික භාර නොගත් සිසුන්ගේ මහපොළ ශිෂ්‍යත්වය අත්හිටුවීම - 2019/2020**

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයේ සම්ප්‍රදායට අනුව ශිෂ්‍යත්ව හිමිකම ලැබීම සඳහා ශිෂ්‍යත්වලාභියා විසින් පෞද්ගලිකවම ශිෂ්‍යත්ව සහතිකය භාරගත යුතු අතර එසේ නොවුණහොත් එම ශිෂ්‍යත්වලාභියාගේ මහපොළ ශිෂ්‍යත්වය අවලංගු වේ.

ඒ ඒ පීඨවලට අදාල මහපොළ ශිෂ්‍යත්වලාභී සිසුන්ගේ සහතික පත්‍ර හා ශිෂ්‍යත්ව ප්‍රධාන ලිපි 2022.05.23 දින සිට පීඨ මඟින් බෙදා හැරීම සිදු කළද **මේ වන විටත් සහතික පත්‍ර හා ප්‍රදාන ලිපි ලබා නොගත් සිසුන්ගේ මහපොළ ශිෂ්‍යත්ව වාරික ගෙවීම් ජුනි මසට අදාල වාරිකයේ සිට අත්හිටුවීමට ක්‍රියා කර ඇත.** (ඒ ඒ පීඨවල මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම අත්හිටුවා ඇති සිසුන්ගේ නාම ලේඛනය මේ සමඟ අමුණා ඇත).

මහපොළ ශිෂ්‍යත්ව සහතිකය හා ප්‍රදාන ලිපිය ලබා නොගත් සිසුන්ගේ ඉල්ලීම් සලකා බලා 2023.07.24 දින සිට 2023.08.14 දින දක්වා ශිෂ්‍ය සුබසාධක අංශයේදී මහපොළ ශිෂ්‍යත්ව සහතික හා ප්‍රදාන ලිපි ලබා ගැනීමට නැවත අවස්ථාව සලසා ඇත.

**ඉහත දිනෙන් පසු ලබා නොගන්නා සියලු සහතික මහපොළ භාරකාර අරමුදල වෙත නැවත භාර දෙන අතර සහතික ලබා නොගන්නා සියලු සිසුන්ගේ මහපොළ ශිෂ්‍යත්වය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.**

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුබසාධක අංශය
2023.07.21

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුභසාධක අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ.